ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය

# ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය

# රැකියා පුරප්පාඩු

ජාතික ප්‍රතිපත්ති සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර ඇති ජාතික රක්ෂණ භාර අරමුදල, දැනට අග්‍රහාර වෛද්‍ය රක්ෂණ හා වගා රක්ෂණ වැනි යෝජනා ක්‍රම ක්‍රියාත්මක කරන අතර දේශීය රක්ෂණකරුවන්ගේ ප්‍රතිරක්ෂකයා වශයෙන් 2008 වර්ෂයේ සිට කටයුතු කරන ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කර ඇති එකම ආයතනය වේ. 2006 වර්ෂයේදී පිහිටුවන ලද මෙම අරමුදල් මණ්ඩලය වසර 10ක කාලයක් තුළදී නවකරණය, වර්ධනය හා ලාභදායීත්වය සැලකීමේදී දේශීය රක්ෂණ කර්මාන්තයේ ප්‍රමුඛ ස්ථානයක් හිමිකර ගෙන ඇති රාජ්‍ය ආයතනයකි.

ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලයේ පහත සඳහන් පුරප්පාඩු සඳහා සුදුසුකම් ලත් පුද්ගලයන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## කාර්යාල කාර්ය සහායක - III ශ්‍රේණිය (PL-1)

### අධ්‍යාපන සුදුසුකම්:

අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටීම.

*** රක්ෂණය ක්ෂේත්‍රයේ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සළකනු ලැබේ.**

### වැටුප් පරිමාණය:

**PL 1-2016: රු. [24,750 -10 x 250 -10 x 270 -7 x 300 -15 x 330 – 37,000]**
(2020 සිට හිමිකම් ඇත.)

කළමණාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛ 02/2016 අනුව 2016 වසර සඳහා මූලික වැටුප රු.14,494/-ක් වන අතර ගැලපුම් දීමනාව රු.9,976/-වේ.

### වයස:

අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. රජයේ ස්ථිර සේවයේ නියුතු නිලධාරීන්ට සහ අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

### පත්වීම:

මෙම පත්වීම ස්ථිර පත්වීමක් වේ සේවක අර්ථ සාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල සඳහා හිමිකම් ඇත.

### කොන්දේසි:

සියලුම අයදුම්කරුවන්,

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
- තනතුරට අදාළ කාර්යයන් සිදු කිරීම සඳහා මානසික හා ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.
- යහපත් චරිත ස්වභාවයකින් යුක්ත විය යුතුය.

### අයදුම්කරුවන්,

නිර්දේශකයන් දෙදෙනෙකු නම් සහ ලිපිනයන් සහිතව සකස් කරන ලද ජීව දත්ත විස්තර සහිත අයදුම්පතක්, සියලුම අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද සනාථ කිරීමේ පිටපත් සමඟ එවිය යුතු වේ.

දැනටමත් රාජ්‍ය/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල වල සේවයේ නියුතු නිළධාරීන් තම ආයතන ප්‍රධානියා හරහා අයදුම්පත එවිය යුතු වේ.

අයදුම්කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සටහන් කර ප්‍රධාන විධායක නිලධාරී, ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය, නො: 97, මරදාන පාර, කොළඹ 10 යන ලිපිනයට 2016.12.03 දිනට පෙර එවිය යුතු වේ. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

---

ප්‍රධාන විධායක නිළධාරී
**ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය**
නො. 97, මරදාන පාර
කොළඹ 10,
ශ්‍රී ලංකාව.